C

## නිවේදනය

සියලුම ගරු මන්ත්‍රීවරුනී, අද අපර භාග 5.00ට අයවැය කාරක සභා විවාදය අවසානයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුකූලව 2017 විසර්ජන පනත් කෙටුම්පත තුන්වැනි වර කියවීම සම්මත කිරීම සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තු සභා ගර්භයේ අලුතින් සවිකර තිබෙන විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ පද්ධතිය භාවිතා කර අත්හදා බැලීමේ පියවරක් ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට සුළු වේලාවක් සභා ගර්භය තුළම රැඳී ඔබ සැමගේ පූර්ණ සහයෝගය ලබා දෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

තවද, ඔබ සැමගේ සභා මේසය මත සවිකර තිබෙන විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ පද්ධතිය භාවිතා කර ඡන්දය ප්‍රකාශ කරන පිළිවෙළ සම්බන්ධයෙන් ඉතාමත් සරලව උපදෙස් ඇතුළත් වර්ණයෙන් මුද්‍රිත භාෂාත්‍රයෙන්ම සකස් කරන ලද පත්‍රිකාවක් ඔබතුමන්ලා එකිනෙකාගේ සභා මේසය මත තබා තිබෙන බැවින් ඒ පිළිබඳ මනා ලෙස අධ්‍යයනය කර විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමට සූදානම් වන ලෙස කාරුණිකව දන්වා සිටිමි.